# අග්‍රහාර වෙබ් පිවිසුම

**(Agrahara Web Portal)**

## අග්‍රහාර සාමාජිකයන් සඳහා වන පරිශීලක අත්පොත

අනුවාදය 2.0

ජාතික රක්ෂණ භාර අරමුදල
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# <u>පටුන</u>

1. හැඳින්වීම 03
2. ප්‍රතිලාභ 03
3. අවම අවශ්‍යතා 03
4. සාමාජික ගිණුමක් සාදා ගැනීම 04
5. පෙර සාදන ලද සාමාජික ගිණුමට පිවිසීම 07
6. නිතර අසනු ලබන ගැටළු සහ විසඳුම් 11
7. ආරක්ෂක උපදෙස් 12
8. සහය සේවාව 12

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා රාජ්‍ය සේවකයන් වෙනුවෙන් ලබාදෙන අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය සඳහා අග්‍රහාර වෙබ් සේවාවට සාමාජිකයෙකු ලෙස ලියාපදිංචිවීම සහ / හෝ තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය පියවර පැහැදිලි කිරීමට මෙම මාර්ගෝපදේශය සකස් කර ඇත.


## 2. ප්‍රතිලාභ

- සාමාජිකයාගේ තොරතුරු තහවුරු කරගත හැකි බැවින් කඩිනමින් හිමිකම් ලබා ගැනීම
- සාමාජිකයාට හිමි ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු කඩිනමින් ලබා ගත හැකි වීම
- පෞද්ගලික රෝහල් මගින් අග්‍රහාර සාමාජිකයන්ට පිරිනමන විශේෂිත වට්ටම් ලබා ගැනීම
- ඉදිරියේදී අවම ලිකියවිලි ප්‍රමාණයකින් හිමිකම් අයදුම් කිරීමේ හැකියාව

## 3. අවම අවශ්‍යතා


- ස්ථාවර අන්තර්ජාල සම්බන්ධතාවයක්
- අන්තර්ජාල බ්‍රව්සරයක් සහිත පරිගණකයක් හෝ ජංගම දුරකථනයක්

## 4. සාමාජික ගිණුමක් සාදා ගැනීම.




පළමු පියවර වන්නේ www.nitf.lk වෙබ් අඩවියට ගොස් "Member Registration" මත ක්ලික් කිරීම හෝ https://nitf.lk/en/member_login/signup.php සබැඳිය භාවිතා කිරීමයි.

නව ලියාපදිංචි කිරීමේ පිටුව විවෘත වේ. ලියාපදිංචිය සම්පූර්ණ කිරීම සඳහා පහත පියවරයන් අනුගමනය කරන්න.




## පියවර 1 – මූලික තොරතුරු ඇතුළත් කිරීම

ලියාපදිංචිය සඳහා පහත තොරතුරු ඇතුළත් කරන්න:

i. අශ්‍රහාර සාමාජික මුදල් බැර කිරීම සඳහා භාවිතා කරනු ලබන ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය (නව හෝ පැරණි)
ii. මුලකුරු සමග සාමාජිකයාගේ නම
iii. ඊමේල් ලිපිනය
iv. ජංගම දුරකතන අංකය උදා : - 07x xxx xxxx

ඉන්පසු **Signup** බොත්තම ඔබන්න. ඔබව තොරතුරු සත්‍යාපනය කිරිමේ සහ නව මුරපදයක් සකසා ගැනීමේ පිටුවට යොමු කරනු ඇත.

ඔබ ඇතුලත් කළ ජංගම දුරකතන අංකයට **OTP (One Time Password)** කේතයක් ලැබේ.

සැලකිය යුතුයි **:-**


- යම් හෙයකින් **OTP** අංකය නොලැබුණේ නම් **071 022 4121 / 0712065549** අංකයෙන් විමසීම් කළ හැකිය.

## පියවර 2 – තොරතුරු තහවුරුව සහ නව මුරපදයක් සැකසීම

ඔබගේ ගිණුම සත්‍යාපනය සඳහා:


i. ඔබගේ ජංගම දුරකතන අංකයට ලැබුනු OTP අංකය ඇතුළත් කරන්න. (OTP අංකය නොලැබුනි නම් නව අංකයක් ලබා ගැනීම සඳහා Resend OTP බොත්තම ඔබන්න.)
ii. නව මුරපදයක් සකසා ගන්න. (අක්ෂර 8ක් හෝ ඊට වැඩි විය යුතුය.)
    - අවම වශයෙන් එක් Capital අකුරක්
    - අවම වශයෙන් එක් Simple අකුරක්
    - අවම වශයෙන් එක් ඉලක්කමක්
    - අවම වශයෙන් එක් විශේෂ සළකුණක් (උදා : @,#,$,%)
iii. නව මුරපදය නැවත ඇතුළත් කරන්න.

ඉන්පසු **Validate** බොත්තම ඔබන්න.




OTP තහවුරු කිරීමෙන් පසු:

- ඔබගේ අග්‍රහාර ගිණුම සාර්ථකව නිර්මාණය වන අතර ඔබව ඔබගේ පරිශීලක පිටුවට යොමු කරනු ඇත.





## පියවර 3 – තොරතුරු ඇතුළත් කිරීම හෝ යාවත්කාලීන කිරීම

ඔබගේ සහ යැපෙන්නන්ගේ තොරතුරු ඇතුලත් කිරීමට හෝ යාවත්කාලීන කිරීමට පරිශීලක පිටුවෙහි වම්පස පැතිකඩ මෙනුවෙහි ඇති “ Edit Profile ” බොත්තම ඔබන්න.




වැදගත් :


- මෙහිදී ඔබට හැඳුනුම්පත් අංකය ඇතුලත් කොටස වෙනස් කළ නොහැක.
- රතු තරු ලකුණ යොදා ඇති සියලු කොටස් අනිවාර්යයෙන් නිවැරදිව සම්පූර්ණ කළ යුතුය.
- බැංකු ගිණුම් අංකය, බැංකුවේ නම සහ ශාඛාවේ නම එක්වරකට වඩා යාවත්කාලීන කිරීමට අවස්ථාව නොලැබෙන බැවින් **පරීක්ෂාකාරිව** සහ **නිවැරදිව** තොරතුරු ඇතුලත් කරන්න.





තොරතුරු ඇතුලත් කළ පසු එම තොරතුරු තහවුරුව සඳහා විෂය නිලධාරී වෙත යොමු කිරීම සහ පද්ධතිය වෙත උඩුගත කිරීම සඳහා පරිශීලක පිටුවෙහි පහතින් ඇති " SUBMIT " බොත්තම ඔබන්න.





ඔබ විසින් ඇතුලත් කළ තොරතුරු තහවුරුව සඳහා විෂය නිලධාරී වෙත නිවැරදිව යොමු වී නම් පහත පණිවිඩය තිරය මත දිස්වේ.




# පියවර 4 - පෙර සාදන ලද සාමාජික ගිණුමට පිවිසීම




www.nitf.lk වෙබ් අඩවියට ගොස් "Login" බොත්තම ක්ලික් කිරීමෙන් ලැබෙන මෙනුව තුළින් "Agrahara Members" තෝරන්න. එසේ නොමැති නම් https://nitf.lk/en/member_login/signin.php සබැඳිය භාවිතා කරන්න.

ඔබව "LOGIN" පිටුව වෙත යොමු කරනු ඇත.




i. ජාතික හැඳුනුම්පත් අංකය ඇතුලත් කරන්න.
ii. ඔබ විසින් සාමාජික ගිණුම නිර්මාණය කිරීමේදී ඇතුලත් කරන ලද මුරපදය ඇතුලත් කරන්න.
iii. **Login** බොත්තම ඔබන්න.

මුරපදය නැවත සැකසීම සඳහා " Forgot Password "වෙත පිවිසෙන්න. ඔබගේ අභිමතය පරිදි ඊමේල් ලිපිනයට හෝ ජංගම දුරකතන අංකයට **OTP (One Time Password)** කේතයක් යොමු කර එය උපයෝගී කර ගනිමින් නව මුරපදයක් සකස් කරගත හැක.

Login වූ පසු:
ඔබගේ සහ යැපෙන්නන්ගේ තොරතුරු ඇතුලත් කිරීමට හෝ යාවත්කාලීන කිරීමට ඉහත "පියවර 3" අනුගමනය කරන්න.

## 5. විශේෂ අවධානය සඳහා

- අග්‍රහාර සාමාජිකයෙකු ලෙස සලකනු ලබන්නේ වාරික මුදල් අඛණ්ඩව ජාතික රක්ෂණ භාර අරමුදලට බැරවී තිබේ නම් පමණි. ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය යටතේ මාසික අවකරණ AWP පද්ධතියට උඩුගත කර තිබිය යුතුය. එසේ නොවේ නම් අදාල වැටුප් නිලධාරියා ලවා වැටුප් පද්ධතිය නිවැරදි කරවා ගත යුතුය.
- අග්‍රහාර සාමාජිකයාට පෞද්ගලිකව දත්ත ඇතුලත් කරගත හැක.
- අග්‍රහාර සාමාජිකයන්හට වැඩි ප්‍රතිලාභ සහිත අග්‍රහාර රක්ෂණ ක්‍රමයකට පමණක් මාරු විය හැක (උදා -: "රිදී" සිට "රන්" දක්වා). තමන් දැනට ලබා ගෙන තිබෙන රක්ෂණ ක්‍රමයෙන් පහල රක්ෂණ ක්‍රමයකට මාරු විය නොහැක (උදා -: "රන්" සිට "රිදී" දක්වා).
- සාමාජිකයා විසින් තම අග්‍රහාර සාමාජික මුදල් බැර කර එවනු ලබන නමින් සහ ජාතික හැඳුනුම්පත් අංකය පමණක් භාවිතා කර තම ගිණුම පිළියෙළ කර ගත යුතුය.
- සාමාජිකයා වෙනත් ආයතනයකට මාරු වී යාමේදී (Transfer) නව ආයතනයේ විෂය භාර නිලධාරියා දැනුවත් කර දත්ත පද්ධතියේ අදාල වෙනස්කම් සිදු කර ගත යුතුය.

## 6. නිතර අසනු ලබන ගැටළු සහ විසඳුම්

| ගැටළුව | විසඳුම |
|---|---|
| The system couldn't verify the provided NIC. Please use the NIC registered in the payroll system. | ඔබ ඇතුලත් කරන ලද ජා.හැ.අංකයෙන් අග්‍රහාර සාමාජික මුදල් අප වෙත ලැබී නොමැත. හැඳුනුම්පත් අංකය නැවත පරීක්ෂා කර බලන්න. ඔබ සාමාජික ලියාපදිංචිය සඳහා ඇතුලත් කළ හැඳුනුම්පත් අංකය නිවැරදි නම්, ඔබ ආයතනයේ වැටුප් සැකසීම භාර නිලධාරී වෙතින් ඒ පිළිබඳ විමසා නිවැරදි කර ගන්න. |
| National ID number that you have entered is already exists in database. | මේ වන විටත් ඔබ ඇතුලත් කළ ජා. හැ. අංකය ලියාපදිංචි වී ඇත. Forgot Password මගින් පැරණි ගිණුම නැවත සක්‍රීය කර ගන්න. එසේ නොහැකි නම් ඔබගේ ආයතනයේ අග්‍රහාර විෂයභාර නිළධාරී මගින් ඔබගේ පැරණි පිවිසුම් ගිණුම (login) ඉවත් කර නව ගිණුමක් සාදා ගන්න. |
| Mobile Number is already used. | ඔබ විසින් ඇතුලත් කළ දුරකතන අංකය, පද්ධතිය තුල දැනටමත් ඇතුලත්ව ඇති බැවින් වෙනත් දුරකතන අංකයක් භාවිත කරන්න. |
| OTP නොලැබීම. | ඔබ විසින් ඇතුලත් කල ජංගම දුරකතන අංකය නිවැරදි දැයි පරීක්ෂා කර බලන්න. |
| Your data has been send to approve or may be in edit queue. Please contact your authorized officer for more details. | ඔබ විසින් පෙර අවස්ථාවේදී උඩුගත කරන ලද තොරතුරු තවම අනුමත කර නොමැත. ඔබ ආයතනයේ විෂයභාර නිලධාරීගෙන් ඒ පිළිබඳව විමසන්න. |
| Incorrect NIC OR Password ! | Username සහ Password පරීක්ෂා කරන්න. |
| Password අමතක වීම. | Forgot Password භාවිතා කරන්න. |

## 7. ආරක්ෂක උපදෙස්

- Password/OTP වෙනත් පුද්ගලයන් සමඟ බෙදා නොගන්න.
- පොදු පරිගණක භාවිතා කිරීමෙන් පසු Logout වන්න.

## 8. සහය සේවාව

අග්‍රහාර පද්ධතිය සම්බන්ධ ගැටළු සඳහා:

- Help Desk - 0711784547, 0711784552
- IT Support Division - 071 022 4121, 0712065549
- Email Support - awp@nitf.lk